❖ මෙවැනි සුදුසු උදාහරණ තුනක් සහිත ව පිළිතුරු ලබාදීම ප්‍රමාණවත් ය.

❖ අදාළ උද්ධෘත ඒ අයුරින් ම උපුටා ගෙන නොමැති වුව ද ශිෂ්‍යයාගේ වචනයෙන් විස්තර කර ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

අදාළ උදාහරණ සඳහා එක් උදාහණයකට ලකුණු 02 බැගින් ලකුණු 06 යි. (02 x 3 = 06 යි)

මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06 යි. (02 x 3 = 06 යි)

භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02 යි.

නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01 යි.

(ලකුණු 06+06+02+01 = 15 යි)

(ලකුණු 15 යි)

5. මානුෂීය ගුණයෙන් හෙබි නිර්ව්‍යාජ කලා ශිල්පියෙකු ලෙස තුංමංහන්දිය නවකතාවේ අබිලිංගේ චරිතය නිරූපණය වන ආකාරය නිදසුන් තුනක්වත් දෙමින් විමසන්න.

- උස් පහත් භේදයකින් තොර ව සියලු දෙනාට උපකාර කිරීම
- ගමේ පැවැත්වෙන මංගල/ අවමංගල හා වෙනත් පොදු කටයුතුවල දී තම කලා හැකියාවෙන් උපකාර කිරීම
- තම සේවාව සඳහා මුදල් අපේක්ෂා නොකිරීම
- සැරසිලි කටයුතු සඳහා වැය වන වියදම පමණක් අය කිරීම
- ලබා දෙන මුදල් පවා ප්‍රතික්ෂේප කිරීම
- තමාට බැණ වදින, අපහාස කරන අය කෙරෙහි පවා අමනාපයක් ඇති කර නොගැනීම
- තම කලා හැකියාවන් නිර්ලෝභී ව සිරිසේනට ප්‍රගුණ කරවීම

මෙවැනි උදාහරණ 03ක් වත් සහිත ව පිළිතුරු ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න. නවකතාවේ පාඨ ඒ අයුරින් ම උපුටා ගෙන නොමැති වුව ද ශිෂ්‍යයාගේ වචනයෙන් විස්තර කර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

අදාළ උදාහරණ සඳහා එක් උදාහණයකට ලකුණු 02 බැගින් ලකුණු 06 යි. (02 x 3 = 06 යි)

මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06 යි. (02 x 3 = 06 යි)

භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02 යි.

නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිතව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01 යි.

(ලකුණු 06+06+02+01 = 15 යි)

(ලකුණු 15 යි)

***

- මල් සුඹුලක්/ මල් දරණුවක් ගෙතීම -
  පබාවතිය සඳහා අලංකාර මල් සුඹුලක්/ මල් පලඳනාවක්/ මල් දරණුවක් ගෙතීම
- රසවත් ආහාර පිසීම -
  මද්‍ර රජුගේ රජ වාසල මුළුතැන්ගෙයි සිට සූපවේදියෙකු ලෙසින් රසවත් ආහාර පිසීම

❖ මෙවැනි කරුණු සහිත ව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී තිබිය යුතු ය. මෙයට අමතර වෙනත් සුදුසු උදාහරණ දක්වමින් සපයන ලද පිළිතුරු සඳහා අදාළ ලකුණු ප්‍රදානය කළ යුතු ය.

❖ උදාහරණ ඒ අයුරින් ම උපුටා ගෙන නොමැති වුව ද ශිෂ්‍යයාගේ වචනයෙන් ලියා තිබුණ ද සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

අදාළ උදාහරණ සඳහා එක් උදාහණයකට ලකුණු 02 බැගින් ලකුණු 06 යි. (02 x 3 = 06 යි)

මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06 යි. (02 x 3 = 06 යි)

භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02 යි.

නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01 යි.

(ලකුණු 06+06+02+01 = 15 යි)

(ලකුණු 15 යි)

4. මාපිය, දූදරු සෙනෙහස මනුෂ්‍යයන්ට මෙන් ම සත්ත්ව ලෝකයට ද පොදු ය. ඇත් ගාලේ දරුපෙම පද්‍ය නිර්මාණය ඇසුරෙන් විමසන්න.

- ඇත් මවට පහර දීම නිසා ඇත් පැටියා සිත් තැවුලට පත්වීම
  උදා:
  මොකටද අම්මේ
  අම්මට ගැහුවේ .......

  ඇඟපත තැළිලා
  රිදෙනව ඇතිනේ

- දරුවාට කිරි දීමට නොහැකි වීම ගැන මවට ඇති වන සිත් වේදනාව
  උදා:
  අනේ පුතේ මට
  කන්න බොන්න නෑ .......

  අයිනක ඉඳලා
  දුවන අම්මලා .......

- රැළේ එක් දරුවෙකු වෙනුවෙන් ඇත් රැළේ සියලු අම්මලාට කිරි එරීම
  උදා:
  එක් දරුවෙක් ඇති
  වුණොත් රැළේ අපෙ .......

  වෙනස් කමක් නෑ
  එක සෙනෙහසමයි .......

10

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



- නංගී උණ පතුරු සඟවා ගන්නා අවස්ථාව
- නංගී අයියාට පහර දෙන අවස්ථාව

- කුඩුවට කඩදාසි අලවන අවස්ථාව සහ එය එල්ලන අවස්ථාව
    - කුඩුවට කොළ අලවන ආකාරය
    - නංගී පියරු තවරාගෙන සිටීම ගැන අයියා විහිළු කරන අවස්ථාව
    - කුඩුව එල්ලන ආකාරය

- වෙසක් පහන ගිනි ගන්නා අවස්ථාව
    - කුඩුවේ ඉටි පහන් දැල්වීම
    - කඩදාසි පටියකට ගිනි ඇවිලීම
    - අයියා එය නිවීමට උත්සාහ කිරීම
    - අයියාගේ අතට ගිනි ඇවිලීම

❖ ඉහත අවස්ථා අතුරින් සුදුසු උදාහරණ තුනක් ඇතුළත් වන සේ පිළිතුරු සපයා තිබීම ප්‍රමාණවත් ය. ඒ අයුරින් ම උපුටා ගැනීමෙන් තොර ව ශිෂ්‍යයාගේ වචනයෙන් විස්තර කර තිබුණ ද සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06 යි. (02 x 3 = 06 යි)

මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06 යි. (02 x 3 = 06 යි)

භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02 යි.

නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිත ව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01 යි.

(ලකුණු 06+06+02+01 = 15 යි)

(ලකුණු 15 යි)

මෙහි දක්වා ඇති උදාහරණවලට අමතර ව වෙනත් සුදුසු උදාහරණ සහිත ව සැපයූ පිළිතුරු සඳහා ද අදාළ ලකුණු ප්‍රදානය කරන්න.

3. 'කුස රජතුමා, උසස් රසවින්දනයෙන් හෙබි විශිෂ්ට කලා ශිල්පියෙකි.' නිර්දිෂ්ට ජාතක කතාවෙන් නිදසුන් තුනක්වත් දෙමින් ඔබේ අදහස දක්වන්න.

- මූර්ති නිර්මාණය -
  ජීවමාන ස්ත්‍රියකට සමාන රන් රුවක් නිර්මාණය
- වීණා වාදනය හා ගීත ගායනය -
  සාගල නුවරට ගොස් පබාවතියට ඇසෙන සේ ගී ගයමින් වීණා වාදනය කිරීම
- මැටි බඳුන් නිර්මාණය -
  සාගල නුවර දී මද්‍ර රජුගේ කුඹලාගේ අතවැසි වෙමින් අලංකාර මැටි බඳුන් නිර්මාණය කිරීම
- තල් වැටක් කරවීම -
  පබාවතියගේ රූපය සහිත විසිතුරු තල් වැටක් නිර්මාණය කිරීම

9

- ○ සෑම පද්‍ය පාද දෙකක් අවසානයේ එළිවැට යොදා ඇත.

  උදා:

  පුතුටයි
  පිහිටයි
  පොළොවයි

- ○ එළිසමය භාවිතය යන්න පිළිතුරෙහි ඇතුළත් වීම අත්‍යවශ්‍ය නැත.
- ○ නිදහස් ආකෘතියෙන් ලියා තිබීම යන කරුණ නිදසුන් සහිත ව තහවුරු කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න

- අජීවී වස්තූන්ට සජීවී බව ආරෝපණය

  උදා:

  " සතර අතින් මුහුද නැඟී "
  " වෙරළ දිගින් මුතු මතු වී "
  " යසස උදා වෙයි"
  " පොළොව පලා මිණි රුවනින් "
  " ඉසුරු ගලා එයි "

විස්තරයට ලකුණු 05 යි
උදාහරණවලට ලකුණු 03 යි
(ලකුණු 05 + 03 = 08 යි)

- පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු
  - අතීත උරුමය, බොදු උරුමය හා ස්වභාව සෞන්දර්ය මතු කිරීම
  - මැනවින් භාෂාව භාවිත කිරීම
  - රචකයාගේ අරමුණ සාක්ෂාත් කර ගැනීම

  යන ඉහත කරුණු මැනවින් සම්පිණ්ඩනය කර තිබීම

විස්තරයට ලකුණු 05 යි
උදාහරණවලට ලකුණු 03 යි
(ලකුණු 05 + 03 = 08 යි)

2. 'තාත්වික සිද්ධි හා අවස්ථා නිරූපණය වෙසක් පහන කෙටිකතාවේ සාර්ථකත්වයට හේතු වී ඇත.' නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

- වෙසක් පහන නිර්මාණය කිරීමට තීරණය කරන අවස්ථාව හා උණ පතුරු සූදානම් කරන අවස්ථාව
  - ○ උණ පතුරු සකස් කිරීම

8

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



- පද්‍ය නිර්මාණයේ අතීත උරුමය, බෞද්ධ උරුමය සහ ස්වභාව සෞන්දර්ය මතු කෙරෙන අවස්ථා

අතීත උරුමය - විහාර මහා දේවිය, මද්දුම බණ්ඩාර, රාජසිංහ, මහසෙන් ආදි වීරවරයන් ස්මරණය කිරීම

උදා:

විහාර මහා මැණිවරුන්
රාසිහ මහසෙන් දෙවිඳුන්

බෞද්ධ උරුමය - රුවන්වැලි සෑය, ශ්‍රී මහා බෝධිය, දළදා මාළිගය ආදි වූ ඓතිහාසික ව අප ලත් බෞද්ධ උරුමය

උදා:

මහසෑ රන්කොත මුදුනේ
දළදා හිමි රැඳි විමනේ

ස්වභාව සෞන්දර්යය - රටේ ස්වභාව සෞන්දර්යය, මුහුදෙන් මුතු, පොළොවෙන් මැණික් ලැබී ඉසුරුමත් වීම

උදා:

සතර අතින් මුහුද නැගී
ලැබුව නිධානයි

විස්තරයට ලකුණු 05 යි
උදාහරණවලට ලකුණු 03 යි
(ලකුණු 05 + 03 = 08 යි)

- භාෂා භාවිතයේ විශේෂතා
    - සරල බස්වහර

        උදා: සුදුසු උදාහරණ දැක්විය යුතු ය

    - අනුප්‍රාසය

        උදා-

        - පුතු ඉපදුණු මේ දෙරණේ <u>උරුමය පුතුටයි</u>
        - ඒ පොළොවේ ඔද තෙද ගුණ <u>පුතු හට පිහිටයි</u>
        - පුතු සිත සතසයි
        - ඔද තෙද ගුණ
        - මුතු මතු වී
        - හැමදා හැම දුක් දුරලා

    - නිදහස් ආකෘතිය

        - මෙය නිදහස් ආකෘතියෙන් ලියා ඇත.
        - එසේ වුවත් මෙහි සමාන මාත්‍රා සහිත ව කවියේ පාද වෙන් කර ඇත

7

# 47- සිංහල සාහිත්‍ය රසාස්වාදය

## II කොටස

1. පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

පුතු ඉපදුණු මේ පොළොවේ
උරුමය පුතුටයි
ඒ පොළොවේ ඔද තෙද ගුණ
පුතුහට පිහිටයි

විහාර මහ මෑණිවරුන්
ඉපදුණු පොළොවයි
මද්දුම බණ්ඩාර පුතුන්
ඉපදුණු පොළොවයි
රාසිහ මහසෙන් දෙවිඳුන්
ඉපදුණු පොළොවයි
මින් මතුවට ඒ පොළොවේ
උරුමය පුතුටයි.

මහ සෑ රන් කොත මුදුනේ
ගත රන් කිරණයි
සිරිමා බෝ මැඩ සෙවනේ
සිහිලැල් පවනයි
දළදා හිමි රැඳි විමනේ
බුදුරැස් දහරයි
නැමඳා හැම දුක් දුරලා
පුතු සිත සනසයි

සතර අතින් මුහුද නැඟී
පවුරු සදාලයි
වෙරළ දිගින් මුතු මතු වී
යසස උදා වෙයි
පොළොව පලා මිණි රුවනින්
ඉසුරු ගලා එයි
පොළොව එවන් පුතු උරුමෙන්
ලැබුව නිදානයි

- මෙම පද්‍ය පන්තියේ රචකයාගේ අරමුණ

රට, ජාතිය, ආගම හා ස්වභාව සෞන්දර්යය පිළිබඳ අභිමානය ඇති කිරීම

විස්තරයට ලකුණු 06 යි

(උදාහරණ නොතිබුණ ද ලකුණු ප්‍රදානය කරන්න)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) **'නිලධාරීන්ට විශ්වාසය දෙන්ට එපා' යැයි කවියා පවසන්නේ ඇයි?**

- නිලධාරීන් ගම්මුන්ගේ සමගිය නැතිකර දැමීම සඳහා විවිධ උපක්‍රම යොදමින් කටයුතු කරන නිසා
- කුල භේදය ඇති කිරීම සඳහා බොරු කතා පවසමින් ගම්මුන්ගේ සමගිය නැතිකිරීම නිසා
- කුලමල වැනි භේද ඇති කරවන නිසා
- කුල භේදය ඇති කිරීමට වැරදි දේ/ බොරු කියමින් ගම්මුන්ගේ සමගිය නැති කිරීම නිසා

(ලකුණු 04 යි)

(iii) මෙම පද්‍ය පන්තියේ භාවිත ආකෘතිය පිළිබඳ කෙටියෙන් විමසන්න.

1. සිවුපද ආකෘතියෙන් ලියා තිබීම
2. එළිවැට/ එළිසමය භාවිත කිරීම

(ලකුණු 06 යි)

(iv) අභිමානවත් ජන සමාජයක් බිහි කිරීම සඳහා කවියා විසින් සිදු කරනු ලබන යෝජනා **දෙකක්** සඳහන් කරන්න.

- තම යුතුකම් ඉටු කිරීමට බිය නො වීම
- උසස් නිලධාරීන් ඉදිරියේ දණ නොනැමීම
- අසාධාරණයට/අයුක්තියට එරෙහි වීම
- දිවි හිමියෙන් රට, ජාතිය බේරා ගැනීමට කටයුතු කිරීම
- තමන්ගේ යහපත් අරමුණු ඉටු කරගන්නා තෙක් කිසිවෙකු කෙරෙහි විශ්වාසය නොතැබීම
- අඬදබර නොකිරීම
- බියෙන් අහුමුලුවල සැඟවී නොසිටීම

(ලකුණු 06 යි)

5

(iv) මෙම ඡේදයට අනුව බුදුන් වහන්සේ ධර්ම සභාවට වැඩම කරවීමට හේතුව පැහැදිලි කරන්න.

නන්ද තෙරුන්ගේ පෙර ආත්මභාවයේ කථාවක් දේශනා කිරීම මගින් අවුරුදු පන්දහසක් පුරා බොහෝ දෙනාට සෙත සැලසෙන බව සිතා

(ලකුණු 06 යි)

**නැතහොත්**

උපන්නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ

නම්බුව කැමති අය ඇති නම් නො වී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලොම් සිදුරක තරම් වත් ළඬ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උපන් ගමේ බල උරුමය රැක ගන්ට
සටන් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙන් තොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉතින් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

වදින්නේ නැතිව ලොකු නිලධාරින් ට
තමන්ගේ බලය උරුමය රැක ගන් ට
හිතින්වත් කැමති නම් එය කර ගන් ට
ඉතින් ඇඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අතත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
කතත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අයුක්තකට අත් දෙක ඔසවන්ට එපා

අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල්වැසියා යන සියල් ලම
අපේ අතට අවතන කර ගෙන වහම
අපේ නමට සලකන දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

(i) 'අයුක්තකට අත්දෙක ඔසවන්න එපා' යන්නෙන් කවියා අදහස් කරන්නේ කුමක් ද?

අයුක්තිය/ අසාධාරණය වෙනුවෙන් කිසිවිටෙක තම කැමැත්ත ලබා දීමට කටයුතු නොකරන්න

(ලකුණු 04 යි)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

2. පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

බුදුහු ඒ අසා 'මහණෙනි, යම් සේ සෙවිලි නො දැන්මෙන් නපුරු කොට සොයාලූ ගෙය වැසි නැති විවෙක මුත් වැස්ස වට විට ම තෙමේ ද, එ පරිද්දෙන් සමථ භාවනා, විදර්ශනා භාවනා නැමැති සෙවිල්ල නො දන්නා හෙයින් තදංග විමුක්ති නැමැති එක් තරම් සෙවිල්ලකින් සොයාලූ සිත් නැමැති ගෙයක් කෙලෙස් නැමැති එක් තරම් වැස්සක් වටත් තෙමී මුත් නො හරණේ ය. යම් සේ සෙවිල්ල දන්නවුන් යහපත් කොට සොයාලූ ගෙය එක්තරා වැස්සකින් තබා මහත් වැස්සකිනුත් නො තෙමේ ද එපරිද්දෙන් ද්විප්‍රකාර භාවනා නැමැති තර සෙවිල්ලෙන් සොයා ලූ සිත් නැමැති ගෙය සසර මහ මුහුදු පුරන තරම් වූ කෙලෙස් මග වැසි වටත් නො තෙමේ'යි වදාළ සේක.

ඒ අසා නන්ද තෙරුන් වහන්සේගේ නුගුණ කියන්ට ගිය වහන්දෑ සෝවාන් ඵලාදියට පැමිණීමෙන් ලොවුතුරා ගුණය ලත් සේක. සත්‍ය අසත්‍ය නොදත් වහන්දෑ චතුස්සත්‍යය දත් සේක. ධර්ම සභායෙහි ද කථාවෙක් උපදනේ, බුද්ධවරුන් වහන්සේ නම් ඉතා ආශ්චර්ය සේක. ජනපද කල්‍යාණීන් නිසා නිවන් සම්පතින් පිරිහෙන්ට සිටි මලණුවන් වහන්සේට එක් තරම් දෙයක ඇවිටි ඇත්තවුන්ට වැඩියුරු දෙයක් පැලා ඇවිටි කළ එක් තරම් දෙයෙහි ඇවිටි හරවන්නා සේ දනවුකලණ බිසොවුන් කෙරෙහි කළ ඇවිටිය දෙව්ලොවට ගෙන ගොසින් දෙව්ගනන් පැලා අරවාලූ සේක. මේ අනික් කාට පිළිවන් දැ'යි යන කථාව ය.

බුදුහුත් වහන්දෑ කරන කරන කතාව දිව්කනින් අසා වදාරා, 'භික්ෂූහු නන්දයන් ශාසනයෙහි ඇලුම් කරවා ගත් නියාව අරභයා කතාව කෙරෙති. මම එ තෙනට ගියෙම් නම් 'හෙම්බා මහණෙනි, ඒ දැන් මතු නොවන්නේ වේ ද යටගිය දවසත් තෙල ලෙස ම උන්ට ඇති වූ ඇවිටියක් හැරවීම් කියාලා ඒ හගවන්ට ජාතක කතාවක් ගෙන හැර දක්වම්. මාගේ මේ ජාතක දේශනාව පස්වා දහස මුළුල්ලෙහි බොහෝ දෙනාට බොහෝ ප්‍රයෝජන සාධා දෙන්නේ ය'යි සිතා වදාරා ධර්ම සභාවට වැඩ සුවිනීතව සුශික්ෂිතව වැඩහුන් පර්ෂද බලාපියා 'රත් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙලුම් වනයක් සේ මේ භික්ෂු පර්ෂද ඉතා හොබිති. මම පළමු කොට කතාවට ආරම්භයක් කෙළෙම් නම් මින් පෙරාතු කොට බසක් බැණ නැගෙන කෙනෙක් නැත. මම ම පළමු කොට කථාව උපදවම් යි සිතා 'මහණෙනි, මා එන්නාට පෙරාතු කොට කෙසේ වූ කථාවක් කොට හුණු දැ'යි විචාරා වදාරා මේ කතාව නියාව දැන්වූ කල්හි 'මහණෙනි, ඒ දැන් මතු නොවේ'යි වදාරා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ භස්ම ප්‍රච්ඡන්න ජාත වේදයක් සේ භවයෙන් සැඟවී තුබූ ඉකුත් වත් කථාව දක්වන සේක්.

(i) 'සුවිනීතව සුශික්ෂිතව වැඩහුන් පර්ෂද බලාපියා' යන්නෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

ඉතා විනීත ව, ඉතා සංවර ව වැඩ සිටි (හික්මීමකින් යුතු ව වැඩ සිටි) පිරිස දෙස බලා

(ලකුණු 04 යි)

(ii) මෙම පාඨයෙහි ඇතුළත් උපමා **දෙකක්** උපුටා දක්වන්න.

" ඇවිටි කළ එක් තරම් දෙයෙහි ඇවිටි හරවන්නා සේ "

" රත් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය නෙලුම් වනයක් සේ "

" හස්ම ප්‍රච්ඡන්න ජාතවේදයක් සේ "

× 2 ම [illegible]

(ලකුණු 04 යි)

(iii) මෙම ඡේදයට අනුව ජනපද කල්‍යාණිය කෙරෙහි නන්ද තෙරුන්ගේ සිතෙහි වූ ඇල්ම දුරු කිරීමට බුදුන් වහන්සේ ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

නන්ද තෙරුන් දෙව්ලොවට රැගෙන ගොස් දෙවඟනන් පෙන්වා ඔවුන් කෙරෙහි ඇල්මක් ඇති කරවීම. එයින් ජනපද කල්‍යාණිය කෙරෙහි ඇති ආලය දුරු කරවීම.

3

(ලකුණු 06 යි)

(iv) කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිචටයෝ ද උසස් වෙති බෝ සෙයින්

(අ) මෙහි මුල් කවි පද දෙකෙහි අදහස ලියන්න.

කටට ගැනීමට පවා බොහෝ අසීරු වූ මුහුදු ජලය ඔබ (වැහි වලාකුළ) සයුරෙන් (මුහුදෙන්) ගත් පසු

(මෙම අදහස වෙනත් වචනවලින් ලියා තිබුණ ද ලකුණු පිරිනමන්න)

(ආ) මෙම පැදි පෙළේ රචකයා කවුද?

කුමාරතුංග මුනිදාස

(v) "හාමිනේලා ඉක්මනට ම යන්ඩ වගේ. ඇයි නැටුම් බලන්ඩ හිටින්නෙ නැද්ද?"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ නම ලියන්න.

තුංමං හංදිය

(ආ) මෙම නිර්මාණයේ රචකයාගේ නම ලියන්න.

මහගම සේකර (මහගම කරියා) සේකර

(ලකුණු 04 X 5 = 20 යි)

2

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# 47- සිංහල සාහිත්‍ය රසාස්වාදය

## I කොටස

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(i) "තොපගේ ස්වාමිපුත්‍රයාණන්ගේ ශ්‍රී විභූතිය බලව"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

සීලවතී බිසව/ කුසගේ මව/ පබාවතියගේ නැන්දණිය/ ඔක්කාක රජ බිසව

(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

පබාවතියට/ ප්‍රභාවතී දේවියට/ කුස රජ බිසවට/ සීලවතී බිසවගේ ලේලියට

(ii) කුලුණු ගුණින් යුතු උතුමන් සිත මහරු
දුදන බසින් නො යෙදෙයි කරනට නපුරු
**නව රුවනින්** පිරි මහ සමුදුර ගැඹුරු
**තණ සුළකින්** උණු කළ හැකි වෙත් කවුරු

(අ) මෙහි මුල් කවි පද **දෙකෙහි** අදහස ලියන්න.

කරුණා ගුණයෙන් යුතු උතුම් පුද්ගලයින්ගේ වටිනා සිත දුර්ජනයන්ගේ වචන නිසා අයහපතක් කිරීමට නොනැමෙයි.

(මෙම අදහස වෙනත් වචනවලින් ලියා තිබුණ ද ලකුණු පිරිනමන්න )

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**නව රුවනින්** මැණික් නවයකින්/ නවරත්නයෙන්/ රුවන් නවයකින්

**තණ සුළකින්** තණකොළ පත්‍රමකින්/ තණකොළ හුළකින්

(iii) "නිදා ගැනීමට ඕනෑ තරම් වෙලා තියෙනවා. ඒ ගැන බය වෙන්න දෙයක් නෑ."

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ නම ලියන්න.

වැලපීම

(ආ) **මෙම නිර්මාණයේ රචකයාගේ නම ලියන්න.**

ඇන්ටන් චෙකොෆ්